# ඇබෑර්තු

## කොළඹ (අගනගර) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

නගර සංවර්ධන, ජලසම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්දලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ කළමනාකරු**<br>**(PS 4 මට්ටම)**<br>**(රසායනික හා අපජල පවිත්‍රකරණය)** | 01 | 1). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත් වී තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද<br>2). රජයේ දීපව්‍යාප්ත සේවයේ iii/ii පංතියේ හෝ ඉහළ හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම සමග iii/ii පංතියේ තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.<br>- අපජලය පවිත්‍රකරණ ක්‍රියාවලියක් හා අපජල පවිත්‍රාගාරයක් ස්ථාපනය, ක්‍රියාත්මක කොට පෙන්වීම සහ පරීක්ෂා කර බැලීම පිළිබඳ පළපුරුද්ද සහිත අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ. |
| **ඉංජිනේරු**<br>**(PS 4 මට්ටම)** | 01 | 1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත්වී තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පශ්චාත් සුදුසුකම්<br>පළපුරුද්ද.<br>2) රජයේ දීපව්‍යාප්ත සේවයේ iii/ii පංතියේ හෝ ඉහළ හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම සමග<br>iii/ii පංතියේ තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද.<br>- අපද්‍රව්‍ය කැටිකිරීමේ උපකරණ, අපද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහන සහ සනීපාරක්ෂක ඉඩම් ගොඩකිරීමේ මෙහෙයුම් උපකරණ පිළිබඳ පළපුරුද්දක් සහිත අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. |
| **ජ්‍යෙෂ්ඨ පරිසර**<br>**(පාරිසරික) නිලධාරී**<br>**(PS 5 මට්ටම)** | 02 | 1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකමක් හෝ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට (NVQ Level 7) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග විශේෂඥතාවය අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක්<br>හෝ<br>2) තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහ කාර්මික/<br>වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට (NVQ Level 6) නොඅඩු ප්‍රවීණතා සහතිකයක්<br>ලබාගැනීමෙන් අනතුරුව විශේෂඥතාවය අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක්<br>3) තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහ කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ Level 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීමෙන් අනතුරුව විශේෂඥතාව අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක්.<br>- අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. |

ඉහත සඳහන් තනතුරු සඳහා වන වැටුප් හා ප්‍රතිලාභ 2019.03.15 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට සමාන වේ. අයදුම් කරනු ලබන දිනය වන විට අයදුම්කරු අපේක්ෂිත සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, ජීවදත්ත, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සහතික කරන ලද පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර ඇතුළත් අයදුම්පත 2020.07.26 වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරේ නම හා ව්‍යාපෘතියේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය. තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. රාජ්‍ය හෝ අර්ධරාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

**අයදුම්පත් එවිය යුත්තේ :** **ලේකම්, නගර සංවර්ධන,**
**ජලසම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය,**
**තැ. පෙ. 48,**
**බත්තරමුල්ල.**